බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 29 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 11 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 03 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සහ උපයෝගී ලේඛනවල ශේෂයන් අතර රු. 72,787 ක එකතු වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ ඊට අදාළ උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුය. | මෙම පොත්පත් නිසි පරිදී යාවත්කාලීන කිරීම මේ වන විට සිදු කරමින් පවතින අතර ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම්
------------------

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්
---------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|---|
| (අ) | 1988 අංක 56, සහ 2000 අංක 53 පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික | පාරිසරික බලපත්‍ර ගාස්තු අයකල යුතු කර්මාන්ත 16 කින් රු. 64,000 ක් වූ ගාස්තු අයකර ගෙන නොතිබුණි. | නෛතික විධිවිධාන පරිදි ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2016 වර්ෂයේ පරිසර බලපත්‍ර ලබා ගත් 2019 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ලබා ගැනීමට නියමිතව තිබූ කර්මාන්ත අතරින් 11 ක සඳහා බලපත්‍ර දී ඇති අතර |

| | | | | |
|---|---|---|---|---|
| | පනතේ 23(අ) කොටස හා අංක 1534/18හා 2008 පෙබරවාරි 01 දිනැති ගැසට් පත්‍රය | | | 03 ක් වසා ඇත. එක් අයෙකු ගෙවීම පැහැර හැර ඇත. මෙයට අමතරව නව කර්මාන්ත 03 කට බලපත්‍ර ලබා දී ඇති බව දන්වමි. |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිලධාරින්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මෙම වර්ෂය අවසන් වීමට පෙර මිලදී ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ඇ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ 2 ඡේදය | වසර 5 කට වරක් වරිපනම් තක්සේරුවක් සිදුකල යුතු වුවත් 2009 වර්ෂයෙන් පසුව වරිපනම් තක්සේරුවක් සිදුකර නොතිබු බැවින් සභා බල ප්‍රදේශයේ පිහිටි වරිපනම් දේපල 981 ක් සඳහා ලබා ගැනීමට හැකිව තිබූ ආදායමක් අහිමිවී තිබුණි. | චක්‍ර ලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය | වරිපනම් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2015 වර්ෂයේ සිට කීප අවස්ථාවකදීම ලිඛිතව දැනුම් දී ඇතත්, මේවන තෙක් තක්සේරු කටයුතු සඳහා පැමිණ නැති බවත්, ප්‍රමාණවත් නිලධාරීන් නොමැති බවට තක්සේරු දෙපාර්තමේන්තුව පවසන බවත් දන්වමි. |
| (ඈ) | 2009 මාර්තු 09 දිනැති අංක 2009/1 දරන සබරගමුව පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ 1.10 සහ 11 වගන්ති. | සභාව සතු කඩ කාමර 6 ක් අතුරු බදු දී තිබුණු අතර, බදු ගිවිසුම අවලංගු කර නැවත ටෙන්ඩර් කිරීම හෝ අතුරු බදුකරු සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව හෝ කටයුතු කර නොතිබුණි. තවද බදු මුදල හා අතුරු බදු මුදල අතර වෙනස රු. 45,850 ක් වී තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය | කඩ කාමර බදු දීමේ විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොමැති අතර මේ වන විට නිවැරදි කිරීමට හා බදු ගිවිසුම් අලුත් කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් පවතින බව දන්වමි. |

| | | |
|---|---|---|
| 1.12 වගන්තිය | බදු ගිවිසුම වාර්ෂිකව අලුත් කිරීමට පියවර ගතයුතු වුවත් 2010 වර්ෂයෙන් පසු බදු ගිවිසුම් අලුත්කර නොතිබුණි | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,172,460 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,081,841 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම , රැස්කල ආදායම හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | (ප්‍රවර්ථන) රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | (ප්‍රවර්ථන) රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් හා බදු | 1,650,280 | 1,351,570 | 1,803,799 | 79,031 | 1,735,400 | 1,351,669 | 1,761,554 | 140,075 |
| ii | කුලී | 697,590 | 825,712 | 825,712 | 523,465 | 1,540,950 | 1,540,950 | 1,064,297 | 523,465 |
| iii | බලපත්‍ර ගාස්තු | 248,840 | 254,690 | 254,690 | - | 298,100 | 277,768 | 277,768 | - |
| iv | වෙනත් ආදායම් | 44,109,952 | 39,883,252 | 28,964,570 | 15,196,181 | 39,056,888 | 36,260,941 | 36,260,941 | 19,893,307 |

#### 2.2.2 වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු. 65,982 ක් වූ අතර එහි වර්ෂ 3 ක කාලය ඉක්ම වූ රු. 17,406 ක් විය. | අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2020 මැයි 31 දින වන විට රු. 21,862 ක මුදලක් අය වී ඇති බවත්, හිඟයෙන් රු. 6,538 ක් කපා හැරීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කර ඇති බවත්, ඉතිරි මුදල අය කර ගැනීමට ක්‍රියා මාර්ග ගන්නා බවත් දන්වමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරින්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 5,088,516 ක් හා රු.7,171,440 ක් වූ අතර වර්ෂයක් ඉක්මවූ හිඟ මුද්දර ගාස්තු ශේෂය රු. 1,966,942 ක් විය. | ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ උපලේඛන ලද වහාම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| නොදිරන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සනීපාරක්ෂක බිම් පිරවුම් ක්‍රම අනුගමනය කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කළයුතුය. | ඝන අපද්‍රව්‍ය කළමණාකරණ ඒකකයේ පවතින අඩුපාඩු නව ප්‍රතිපාදන සොයා ගෙන හෝ ලැබෙන ප්‍රතිපාදන පරිදි ඉදිරි වර්ෂ වල සම්පූර්ණ කරන බව දන්වමි. |

(ආ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| ගලි අපද්‍රව්‍ය බැහැර කිරිම සඳහා සුදුසු ස්ථානයක් සභාව සතුව නොතිබුණ බැවින් එම පහසුකම් ඇති අයට පමණක් සේවාව ලබාදී තිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව ජනතාවගේ සුබවිහරණය සම්බන්ධ කටයුතු ඉටු කල යුතුය. | ප්‍රතිපාදන ලද විට ඉදිරියේදී ජනාකීර්ණ නොවන ප්‍රදේශයකින් ඉඩමක් මිලදී ගෙන ගලි අපද්‍රව්‍යය බැහැර කිරීමට සුදුසු පරිදී ස්ථානයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු වර්ග 7 ක පුරප්පාඩු 11 ක් පැවතුණි. මෙම තනතුරු අතර ආදායම් පරිපාලක තනතුරක් 2019 සැප්තැම්බර් 19 සිටද, සැලසුම් ශිල්පී තනතුරක් 2013 අගෝස්තු 02 දින සිටද, වැඩ ක්ෂේත්‍ර පරිපාලක තනතුරක් 2017 අප්‍රේල් 19 සිටද, පුරප්පාඩුව පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. | මේ වන විට සභාවේ පවතින පුරප්පාඩු සම්බන්ධව මාසිකව පළාත් පාලන කොමසාරිස් හරහා ප්‍රධාන අමාත්‍යාංශය වෙත තොරතුරු දැනුම් දෙනු ලබන බව දන්වමි. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | සභාව සතු රු. 58,935,755 ක්වූ වාහන හා උපාංග පැවතියද, ප්‍රමාණවත් ගරාජ පහසුකම් නොතිබුණි. | වත්කම් ආරක්ෂා කිරීමට පියවර ගත යුතුය. | පවතින රථ නැවතුම් පොළට අළුතින් කොටසක් ඉදි කිරීම සඳහා රු. 421,120 ක් සහිත ඇස්තමේන්තු යෝජනාවක් 2020 ජුනි 09 දින මහ සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද අතර සභා අරමුදලින් ඉදිරියේදී එය ඉදි කරන බව දන්වමි. |
| (ආ) | ප්‍රාදේශීය සභාව සතු පොදු ළිං, සුසානභූමි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් හඳුනාගෙන අයිතිය තහවුරු කර ගත යුතුය. | මේ පිළිබඳව සතොක්ෂණයක් සිදු කිරීමට කමිටුවක්ද පත් කර ඇති අතර අදාළ කටයුතු ඉදිරියේදී කරන බව දන්වමි. |

3.3.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සබරගමුව පළාත් සභාව හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ලබා දෙන ලද වටිනාකම රු. 56,560,755 ක් වූ වාහන හා යන්ත්‍ර 13 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2 (i) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වාහන පවරා ගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතින බවට දන්වමි. |

3.3.3 නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| වටිනාකම රු 6,221,373 ක් වූ ගාර්බේජ් කම්පැක්ටරයක් වර්ෂයක සිටද, රු. 1,300,000 ක් වූ කැබ්රථයක් සහ රු. 2,655,318 ක් වූ ට්‍රැක්ටරයක් වර්ෂ 04 ක කාලයක සිටද නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | සභාවට පරිත්‍යාග වශයෙන් ලබා දී ඇති ගාර්බේජ් කම්පැක්ටරය යොදා ගෙන එකතු කිරීමට ප්‍රමාණවත් කැළිකසළ නොමැති නිසා මෙම රථය හුවමාරු කිරීමට යෝජනා කර ඇත. කැබ් රථය හා ට්‍රැක්ටර් රථය ඩිපෝ ඉංජිනේරු වාර්තාව අනුව අළුත්වැඩියා කිරීමට රජයේ සංවර්ධන යන්ත්‍රෝපකරණ ඒකකයට යොමු කර ඇති බව දන්වමි. |

3.3.4 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සභාව සතු වාහන 15 ක් පැවතියද, තථ්‍ය රියදුරු සංඛ්‍යාව 04ක් වීම හේතුවෙන් වාහන ඌන උපයෝජනයක් සිදුවී තිබුණි. | වාහන සංඛ්‍යාවට සරිලන රියදුරු සංඛ්‍යාවක් අනුමත කරවාගෙන බඳවා ගැනීමට කටයුතු කල යුතුය. | වෙනත් තනතුරුවල කටයුතු කරන බර වාහන රියදුරු බලපත්‍ර සහිත රියදුරන් සේවයේ යොදවා අදාළ කාර්යයන් කරගෙන යනු ලබන බව දන්වමි. |

3.4 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු. 19,776,217 ක ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබූ නමුත්, ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුය. | 2021 වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරන බව දන්වමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි. | චක්‍ර ලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය | 2020 වර්ෂයේ නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන බව දන්වමි. |

4.2 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ කාරණා 09 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පිළියෙල කර තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 වන විටත් අනුමත නොවීම හේතුවෙන් සම්මත අතුරු ව්‍යවස්ථා පමණක් වැලඳ ගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය | එක් අතුරු ව්‍යවස්ථාවක් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යවා ඇති අතර අතුරු ව්‍යවස්ථා තුනක් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයට යොමු කර ඇති අතර අතුරු ව්‍යවස්ථා පහක කෙටුම්පත් සකස් කර ඇති බව දන්වමි. |
| (ආ) | තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන සැලසුම් සකස් කර තිබුණද, අරමුදල් නොමැතිවීම මත ඒවා බොහොමයක් ක්‍රියාත්මකවී නොතිබුණි. | සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අරමුදල් සපයාගත හැකි මාර්ග කෙරෙහි අවධානය යොමුකල යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |